# උපතක් හා මරණයක් ලියාපදිංචි  කිරීම සඳහා CR01 සහ CR02 ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්.

- උපතක් ලියාපදිංචියේදී, දරුවා උපදින අවස්ථාව වනවිට මව්පියන්ගෙන් එක් අයෙක්වත් ශ්‍රී ලාංකික පුරවැසියෙකු හෝ ද්විත්ව පුරවැසිභාවය ලබා ඇති අයෙකු විය යුතු ය.
- මරණයක් ලියාපදිංචියේදී, මරණය සිදු වන අවස්ථාව වනවිට මියගිය තැනැත්තා ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.

## උපතක් ලියාපදිංචි කිරීම සඳහා විස්තර - CR01 ආකෘතිය සම්පූර්ණ කිරීම සඳහා මගපෙන්වීම.

**අනුක්‍රමික අංකය - තානාපති හෝ කොන්සල් නිලධාරියා විසින් සම්පූර්ණ කළ යුතු ය.**

දකුණුපස ඉහළ කෙළවරෙහි ඉලක්කම් 10ක් යොදා සම්පූර්ණ කිරීම සඳහා හිස් කොටු සහිතව මුද්‍රණය කර ඇත. වම් පස සිට අංක කිරීම ආරම්භ කරන්න.

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

එම කොටුවලින් පළමු කොටු හතරෙහි වර්ෂය සඳහන් කළ යුතු ය.

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2 | 0 | 2 | 6 | | | | | | |

පස්වන කොටුවෙහි ආකෘතිය ලියාපදිංචි කිරීම සඳහා භාරගන්නා හඳුනා ගැනීමේ සංකේත අංකය සඳහන් කළ යුතු ය.

ආකෘතිය භාරගනු ලබන්නේ තානාපති හෝ කොන්සල් නිලධාරියා විසින් බැවින් 0 ලෙස සඳහන් කළ යුතු ය.

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2 | 0 | 2 | 6 | 0 | | | | | |

සයවන කොටුවේ සිට දහවන කොටුව දක්වා වූ කොටුවල, ආකෘති පත්‍රයට අදාළ වන අනුක්‍රමික වශයෙන් ලැබෙන අංකය සඳහන් කළ යුතු ය. එම අංකය **සෑම වර්ෂයකදීම** 00001 න් ආරම්භ කර 00002,00003...............ආදී වශයෙන් අනුක්‍රමික අංක පිළිවෙළින් අංක කළ යුතු ය.

උදා:-

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2 | 0 | 2 | 6 | 0 | 0 | 0 | 0 | 0 | 1 |

තානාපති හෝ කොන්සල් නිලධාරියා විසින් CR01 ආකෘතිය දැනුම් දෙන්නාගෙන් භාරගත් දිනය, අනුක්‍රමික අංකයට පහළින් කාර්යාල ප්‍රයෝජනය සඳහා වෙන් කර ඇති කොටුවෙහි සටහන් කළ යුතු ය.

CR01 ආකෘතියට අනුව අතින් ලියා නිකුත් කර ඇති උප්පැන්න සහතිකයේ අංකය හා එය ලියාපදිංචි කිරීමේ දිනය වම්පස ඉහළ කෙළවරේ ඇති කොටුව තුළ සටහන් කරන්න. එසේම CR01 ආකෘතිය භාරගත් අනුපිළිවෙළ අනුව උප්පැන්න සහතික ලියාපදිංචි කළ යුතු ය.

**ළමයාගේ විස්තර** - දැනුම් දෙන්නා විසින් සම්පූර්ණ කළ යුතු ය. (උදා: මව,පියා,භාරකරු විසින්)

තොරතුරු සඳහන් කිරීම සඳහා අංක 1 සිට 8 දක්වා වූ කොටුවලින් මෙම කොටස සමන්විත ය.

**අංක 01 - උපන් දිනය**

'උපන් දිනය' යන වචනයට ඉදිරියෙන් ඇති කොටුව තුළ,

වර්ෂය - ඉලක්කම් හතරක් සහිතව සම්පූර්ණ කළ යුතු ය. උදා :- 2026
මාසය - ඉලක්කම් දෙකක් සහිතව සම්පූර්ණ කළ යුතු ය. උදා:-01,02,......,11,12
දිනය - ඉලක්කම් දෙකක් සහිතව සම්පූර්ණ කළ යුතු ය. උදා:-01,02,.......10,11,12
ලෙස සඳහන් කළ යුතු ය.

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| උපන් දිනය | වර්ෂය/ Year | 2 | 0 | 2 | 6 | මාසය/ Month | 0 | 1 | දිනය/ Date | 0 | 1 |

**අංක 02 - උපන් ස්ථානය පිළිබඳ විස්තර**

'දිස්ත්‍රික්කය' යන වචනයට ඉදිරියෙන් ඇති කොටුව තුළ 'කොළඹ කොන්සියුලර්' ලෙස සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| දිස්ත්‍රික්කය | කොළඹ කොන්සියුලර් |

'ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ උපන් ස්ථානය අයත් වන රට සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉතාලිය |

'ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ උපන් ස්ථානය අයත් වන තානාපති කාර්යාලය පිළිබඳ සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය | රෝමය |

'උපන් ස්ථානය' යන්නට ඉදිරියෙන් ඇති කොටු තුළ සිංහල හෝ දෙමළ භාෂාවෙන් සහ ඉංග්‍රීසි භාෂාවෙන් උපන් ස්ථානය පිළිබඳ සඳහන් කළ යුතු ය.

| | | |
|---|---|---|
| උපන් ස්ථානය | සිංහල හෝ දෙමළ භාෂාවෙන් | නාපොලි |
| | ඉංග්‍රීසි භාෂාවෙන් | NAPOLI |

'උපත සිදු වූයේ රෝහලක ද?' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ ඇති 'ඔව්' සහ 'නැත' යන වචනවලින් අනවශ්‍ය වචනය කපා දැමිය යුතු ය.

| | |
|---|---|
| උපත සිදු වූයේ රෝහලකද? | ඔව් / ~~නැත~~ |

**අංක 03 - සම්පූර්ණ නම (සිංහල හෝ දෙමළ භාෂාවෙන්)**

'සම්පූර්ණ නම (සිංහල හෝ දෙමළ භාෂාවෙන්)' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ උප්පැන්න සහතිකයේ ළමයාගේ සම්පූර්ණ නම සඳහන් කළ යුතු ආකාරයට සිංහල හෝ දෙමළ භාෂාවෙන් නම ලිවිය යුතු ය. ඉදිරියේ දී සෑම අවස්ථාවකදීම මෙම නම භාවිතා කරනු ලැබේ.

| | |
|---|---|
| සම්පූර්ණ නම (සිංහල හෝ දෙමළ භාෂාවෙන්) | සමරසිංහ අප්පුහාමිලාගේ |
| | අදීර සංකල්ප |

**අංක 04 - සම්පූර්ණ නම ඉංග්‍රීසි භාෂාවෙන්(කැපිටල් අකුරෙන්)**

'සම්පූර්ණ නම ඉංග්‍රීසි භාෂාවෙන්(කැපිටල් අකුරෙන්)' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ උප්පැන්න සහතිකයේ ළමයාගේ සම්පූර්ණ නම සඳහන් කළ යුතු ආකාරයට සම්පූර්ණ නම ඉංග්‍රීසි කැපිටල් අකුරින් ලිවිය යුතු ය.

දැනුම්දෙන්නාට ඉංග්‍රීසි භාෂාවෙන් නම ලිවිය නොහැකි නම් එම ස්ථානය හිස්ව තැබිය යුතු ය.

| | |
|---|---|
| සම්පූර්ණ නම් ඉංග්‍රීසි භාෂාවෙන් (කැපිටල් අකුරින්) | SAMARASINGHE APPUHAMILAGE |
| | ADEERA SANKALPA |

**අංක 05 - ස්ත්‍රී පුරුෂ භාවය**

'ස්ත්‍රී පුරුෂ භාවය' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ අදාළ වචනය ලිවිය යුතු ය.

| | |
|---|---|
| ස්ත්‍රී පුරුෂ භාවය | පුරුෂ |

**අංක 06 - උපත් බර**

'උපත් බර' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ පළමු වන කොටුවෙහි කිලෝ ග්‍රෑම් ප්‍රමාණය සහ එයට පසුව ඇති කොටු තුනෙහි ග්‍රෑම් ප්‍රමාණය දැක්විය යුතු ය.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| උපත් බර | 3 | **කි. Kg** | 1 | 3 | 0 | **ග්‍රෑ. g** |

**අංක 07 - සජීවී උපත් අනුපිළිවෙළ (වචනයෙන්)**

'සජීවී උපත් අනුපිළිවෙළ (වචනයෙන්)' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ එම දරුවා අදාළ මවට දාව සජීවිව උපත ලබා ඇති කීවෙනි දරුවා ද යන්න වචනයෙන් ලිවිය යුතු ය.

උදා :- එම දරුවා මවට දාව උපන් පළමු දරුවා නම් "පළමුවන" යනුවෙන්ද, දෙවන දරුවා නම් "දෙවන" යනුවෙන් ද සඳහන් කළ යුතු ය.

එම දරුවා මවට දාව උපන් දෙවන දරුවා වුව ද, පළමු වන දරුවා උපදින අවස්ථාවේ දී මිය ගොස් (අජීවී) සිටියේ නම්, එම දරුවා සජීවී උපත් අනුපිළිවෙල අනුව "පළමුවන" දරුවා වේ.

| | |
|---|---|
| සජීවී උපත් අනුපිළිවෙළ (වචනයෙන්) | පළමුවන |

**අංක 08 - නිවුන් දරු උපතක් නම්, දරුවන් ගණන**

'නිවුන් දරු උපතක් නම්, දරුවන් ගණන' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ 'ඉලක්කමෙන්' සහ 'වචනයෙන්' දරුවන් ගණන සඳහන් කළ යුතු ය. දරුවකු අජීවී ලෙස උපත ලැබුව ද එම දරුවා ද ගණන් ගත යුතු ය.

| | | |
|---|---|---|
| නිවුන් දරු උපතක් නම්, දරුවන් ගණන | ඉලක්කමෙන් | 2 |
| | වචනයෙන් | දෙකයි |

**පියාගේ විස්තර -** දැනුම් දෙන්නා විසින් සම්පූර්ණ කළ යුතු ය.

තොරතුරු සඳහන් කිරීම සඳහා අංක 9 සිට 16 දක්වා වූ කොටුවලින් මෙම කොටස සමන්විතය.

I. දරුවා උපත ලබන දිනට පෙර දෙමව්පියන් විවාහ වී ඇත්නම් හෝ,
II. දරුවා උපත ලබන දිනට පෙර දෙමව්පියන් විවාහ වී නොමැති විටෙක හා එහෙත් උපත ලියාපදිංචියට "උපතක් ලියාපදිංචි කිරීම සඳහා විස්තර" ආකෘතිය ඉදිරිපත් කරන දින වන විට ඔවුන් විවාහ වී ඇත්නම් හෝ,
III. උප්පැන්න සහතිකයේ පියාගේ තොරතුරු ඇතුළත් කර ගැනීමට 'පියා' යයි සැලකෙන තැනැත්තා කැමති නම් මව,පියා යන දෙදෙනාම තානාපති හෝ කොන්සල් නිලධාරියා ඉදිරියේ දී ආකෘතියේ අංක 32හි අදාළ පරිදි කොටුවල හිස්තැන්වල අත්සන් යොදා ඇති අවස්ථාවන්හි දී පමණක් පියාගේ තොරතුරු ඇතුළත් කළ හැකි ය.

**අංක 09 - ශ්‍රී ලාංකිකයෙකු නම්, ජාතික හැඳුනුම්පත් අංකය**

'ශ්‍රී ලාංකිකයෙකු නම්, ජාතික හැඳුනුම්පත් අංකය' යන්නට ඉදිරියෙන් ඇති හිස් කොටුව තුළ පියාගේ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතු ය( අංක 9 කින් යුතු හෝ අංක 12 කින් නිකුත් කරනු ලබන).

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ශ්‍රී ලාංකිකයෙකු නම්, | ජාතික හැඳුනුම්පත් අංකය | | | 9 | 7 | 2 | 6 | 5 | 0 | 4 | 5 | 3 | V |

**අංක 10 - විදේශිකයෙකු නම්**

'විදේශිකයෙකු නම්,රට' යන වචනයට ඉදිරියෙන් ඇති කොටුව තුළ ඔහුගේ ගමන් බලපත්‍රයේ සඳහන් කර ඇති රට පිළිබඳ විස්තර සඳහන් කළ යුතු ය.
'ගමන් බලපත්‍ර අංකය' යන්නට ඉදිරියෙන් ඇති කොටු තුළ ඔහුගේ ගමන් බලපත්‍රයේ සඳහන් කර ඇති අංකය පිළිබඳ විස්තර සඳහන් කළ යුතු ය.

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| විදේශිකයෙකු නම්, | රට | ඉතාලිය | | | | | | | | | | |
| | විදේශ ගමන් බලපත්‍ර අංකය | | | | | A | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |

**අංක 11 - සම්පූර්ණ නම (සිංහල හෝ දෙමළ භාෂාවෙන්)**

'සම්පූර්ණ නම (සිංහල හෝ දෙමළ භාෂාවෙන්)' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ සම්පූර්ණ නම සිංහල හෝ දෙමළ භාෂාවෙන් ලිවිය යුතු ය.

| | |
|---|---|
| සම්පූර්ණ නම<br>(සිංහල හෝ දෙමළ භාෂාවෙන්) | සමරසිංහ අප්පුහාමිලාගේ රවීන්ද්‍ර කිත්සිරි |
| | සමරසිංහ |
| | |

**අංක 12 - සම්පූර්ණ නම ඉංග්‍රීසි භාෂාවෙන්(කැපිටල් අකුරෙන්)**

'සම්පූර්ණ නම ඉංග්‍රීසි භාෂාවෙන්(කැපිටල් අකුරෙන්)' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ සම්පූර්ණ නම ඉංග්‍රීසි කැපිටල් අකුරින් ලිවිය යුතු ය.

| | |
|---|---|
| සම්පූර්ණ නම<br>ඉංග්‍රීසි භාෂාවෙන් (කැපිටල් අකුරින්) | SAMARASINGHE APPUHAMILAGE |
| | RAVINDRA KITHSIRI SAMARASINGHA |
| | |

**අංක 13 - උපන් දිනය**

'උපන් දිනය' යන්නට ඉදිරියෙන් ඇති කොටු තුළ, ඔහුගේ උප්පැන්න සහතිකය අනුව,

වර්ෂය - ඉලක්කම් හතරක් සහිතව සම්පූර්ණ කළ යුතු ය. උදා :- 1997
මාසය - ඉලක්කම් දෙකක් සහිතව සම්පූර්ණ කළ යුතු ය. උදා :- 01,02,......,10,11,12 ලෙස
දිනය - ඉලක්කම් දෙකක් සහිතව සම්පූර්ණ කළ යුතු ය. උදා :- 01,02,........10,11,12 ලෙස

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| උපන් දිනය | වර්ෂය | 1 | 9 | 9 | 7 | මාසය | 0 | 1 | දිනය | 0 | 1 |

**අංක 14 - උපන් ස්ථානය**

'උපන් ස්ථානය' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ පියා ශ්‍රී ලාංකිකයෙකු නම්, ඔහුගේ උප්පැන්න සහතිකය අනුව විස්තර සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| උපන් ස්ථානය | ද සොයිසා කාන්තා රෝහල, කොළඹ |

පියා විදේශිකයෙකු නම්, ඔහු උපන් රට අනුව විස්තර සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| උපන් ස්ථානය | නාපොලි, ඉතාලිය |

**අංක 15 - ජාතිකත්වය**

'ජාතිකත්වය' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ ශ්‍රී ලාංකිකයෙකු නම්,

| | |
|---|---|
| ජාතිකත්වය | ශ්‍රී ලාංකික |

විදේශිකයෙකු නම් ඔහු උපන් රට අනුව ඔහුගේ ජාතිකත්වය සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| ජාතිකත්වය | ඉතාලි ජාතික |

**අංක 16 - ජාතිය**

'ජාතිය' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ පියා ශ්‍රී ලාංකිකයෙකු නම්, ඔහුගේ උප්පැන්න සහතිකය අනුව 'ජන වර්ගය' සඳහන් කළ යුතු ය(උදා: සිංහල, ශ්‍රී ලංකා දෙමළ, ඉන්දියානු දෙමළ, ශ්‍රී ලංකා යෝනක ආදි වශයෙන්).

| | |
|---|---|
| ජාතිය | සිංහල |

පියා විදේශිකයෙකු නම්, ඔහු උපන් රට අනුව විස්තර සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| ජාතිය | ඉතාලි ජාතික |

**මවගේ විස්තර** - දැනුම් දෙන්නා විසින් සම්පූර්ණ කළ යුතු ය.

තොරතුරු සඳහන් කිරීම සඳහා අංක 17 සිට 28 දක්වා වූ කොටුවලින් මෙම කොටස සමන්විත ය.

**<u>අංක 17 - ශ්‍රී ලාංකිකයෙකු නම්, ජාතික හැඳුනුම්පත් අංකය</u>**

'ශ්‍රී ලාංකිකයෙකු නම්, ජාතික හැඳුනුම්පත් අංකය' යන්නට ඉදිරියෙන් ඇති හිස් කොටුව තුළ මවගේ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතු ය(අංක 9 කින් යුතු හෝ අංක 12කින් නිකුත් කරනු ලබන).

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ශ්‍රී ලාංකිකයෙකු නම්, | ජාතික හැඳුනුම්පත් අංකය | | | 9 | 9 | 6 | 6 | 5 | 0 | 4 | 5 | 3 | V |

**<u>අංක 18 - විදේශිකයෙකු නම්,</u>**

'විදේශිකයෙකු නම්, රට' යන වචනයට ඉදිරියෙන් ඇති කොටුව තුළ ඇයගේ ගමන් බලපත්‍රයේ සඳහන් කර ඇති රට පිළිබඳ විස්තර සඳහන් කළ යුතු ය.
'ගමන් බලපත්‍ර අංකය' යන්නට ඉදිරියෙන් ඇති කොටු තුළ ඇයගේ ගමන් බලපත්‍රයේ සඳහන් කර ඇති අංකය පිළිබඳ විස්තර සඳහන් කළ යුතු ය.

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| විදේශිකයෙකු නම්, | රට | ඉතාලිය | | | | | | | | | | | |
| | විදේශ ගමන් බලපත්‍ර අංකය | | | | | B | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |

**<u>අංක 19 - සම්පූර්ණ නම (සිංහල හෝ දෙමළ භාෂාවෙන්)</u>**

'සම්පූර්ණ නම (සිංහල හෝ දෙමළ භාෂාවෙන්)' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ සම්පූර්ණ නම සිංහල හෝ දෙමළ භාෂාවෙන් ලිවිය යුතු ය.

| | |
|---|---|
| සම්පූර්ණ නම (සිංහල හෝ දෙමළ භාෂාවෙන්) | අප්පුහාමිලාගේ අජන්තා කුමාරි |
| | |
| | |

**<u>අංක 20 - සම්පූර්ණ නම,ඉංග්‍රීසි භාෂාවෙන්(කැපිටල් අකුරෙන්)</u>**

'සම්පූර්ණ නම ඉංග්‍රීසි භාෂාවෙන් (කැපිටල් අකුරෙන්)' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ සම්පූර්ණ නම ඉංග්‍රීසි කැපිටල් අකුරින් ලිවිය යුතු ය.

| | |
|---|---|
| සම්පූර්ණ නම ඉංග්‍රීසි භාෂාවෙන් (කැපිටල් අකුරින්) | APPUHAMILAGE AJANTHA KUMARI |
| | |
| | |

**<u>අංක 21 - උපන් දිනය</u>**

'උපන් දිනය' යන්නට ඉදිරියෙන් ඇති කොටු තුළ, ඇයගේ උප්පැන්න සහතිකය අනුව,

වර්ෂය - ඉලක්කම් හතරක් සහිතව සම්පූර්ණ කළ යුතු ය. උදා :- 1999
මාසය - ඉලක්කම් දෙකක් සහිතව සම්පූර්ණ කළ යුතු ය. උදා :- 01,02,......,10,11,12 ලෙස
දිනය - ඉලක්කම් දෙකක් සහිතව සම්පූර්ණ කළ යුතු ය. උදා :- 01,02,........ 10,11,12 ලෙස

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| උපන් දිනය | වර්ෂය | | | | | මාසය | | | දිනය | |
| | 1 | 9 | 9 | 9 | | 0 | 2 | | 0 | 1 |

**අංක 22 - ළමයාගේ උපන් දිනට වයස**

'ළමයාගේ උපන් දිනට වයස' යන්නට ඉදිරියෙන් ඇති කොටු තුළ මවගේ වයස අවුරුදු ගණනින් සඳහන් කළ යුතු ය(සම්පූර්ණ කරන ලද අවුරුදු ගණන).

| | | |
|---|---|---|
| ළමයාගේ උපන් දිනට වයස | 2 | 6 |

**අංක 23 - ජාතිකත්වය**

'ජාතිකත්වය' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ මව ශ්‍රී ලාංකිකයෙකු නම්, 'ශ්‍රී ලාංකික' යන්න සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| ජාතිකත්වය | ශ්‍රී ලාංකික |

විදේශිකයෙකු නම්, ඇය උපන් රට අනුව ඇයගේ ජාතිකත්වය සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| ජාතිකත්වය | ඉතාලි ජාතික |

**අංක 24 - ජාතිය**

'ජාතිය' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ මව ශ්‍රී ලාංකිකයෙකු නම්, ඇයගේ උප්පැන්න සහතිකය අනුව 'ජන වර්ගය' සඳහන් කළ යුතු ය(උදා: සිංහල, ශ්‍රී ලංකා දෙමළ, ඉන්දියානු දෙමළ ආදි වශයෙන්).

| | |
|---|---|
| ජාතිය | සිංහල |

මව විදේශිකයෙකු නම්, ඇය උපන් රට අනුව විස්තර සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| ජාතිය | ඉතාලි ජාතික |

**අංක 25-උපන් ස්ථානය**

'උපන් ස්ථානය' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ මව ශ්‍රී ලාංකිකයෙකු නම්, ඇයගේ උප්පැන්න සහතිකය අනුව විස්තර සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| උපන් ස්ථානය | ද සොයිසා කාන්තා රෝහල,<br>කොළඹ |

මව විදේශිකයෙකු නම්, ඇය උපන් රට අනුව විස්තර සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| උපන් ස්ථානය | රෝමය |

**අංක 26- ස්ථිර ලිපිනය (තාවකාලික පදිංචි ස්ථානය නොවේ)**

මවගේ ස්ථිර ලිපිනය සඳහන් කළ යුතු ය. මව දරු ප්‍රසූතිය සඳහා පැමිණ සිටියදී තාවකාලිකව පදිංචි වී සිටි ස්ථානයේ ලිපිනය සඳහන් නොකළ යුතු ය.

| | |
|---|---|
| ස්ථිර ලිපිනය | නො.27 |
| | ශාන්ත ලෝරන්ස් ද බ්‍රින්ඩිසි |
| | නාපොලි |

'දිස්ත්‍රික්කය' යන වචනයට ඉදිරියෙන් ඇති කොටුව තුළ මවගේ ස්ථිර පදිංචි ලිපිනය අයත් වන නගරයේ නම සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| දිස්ත්‍රික්කය | රෝමය |

**මෙම කොටස සම්පූර්ණ කිරීම අවශ්‍ය නොවේ.**

'ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ මවගේ ස්ථිර පදිංචි ලිපිනය අයත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | |

'ග්‍රාම නිලධාරි කොට්ඨාසය' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ මවගේ ස්ථිර පදිංචි ලිපිනය අයත් වන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නම් සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | |

**අංක 27 - සම්බන්ධ කළ හැකි තොරතුරු**

'ජංගම දුරකථන අංකය' යන වචනයට ඉදිරියෙන් ඇති කොටුව තුළ මව සම්බන්ධ කර ගත හැකි ජංගම දුරකථන අංකයක් වේ නම් එය සඳහන් කළ යුතු ය.

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජංගම දුරකථන අංකය | 0 | 7 | 7 | 7 | 5 | 9 | 9 | 7 | 7 | 7 |

'නිවාස දුරකථන අංකය' යන වචනයට ඉදිරියෙන් ඇති කොටුව තුළ මව සම්බන්ධ කර ගත හැකි ස්ථාවර දුරකථන අංකයක් වේ නම් එය සඳහන් කළ යුතු ය.

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| නිවාස දුරකථන අංකය | 0 | 0 | 3 | 9 | 0 | 8 | 6 | 9 | 3 | 2 | 2 | 0 | 3 | 8 |

'විද්‍යුත් තැපැල' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ මව සම්බන්ධ කර ගත හැකි විද්‍යුත් තැපැල විස්තර (e-mail address) සඳහන් කළ යුතු ය.

**අංක 28 - රෝහලට ඇතුළත් කිරීමේ තොරතුරු(ඔබ සතුව පවතී නම්)**

නිවැරදි විස්තර දන්නේ නම් පමණක් ඇතුළත් කළ යුතු ය.

අංකය යන වචනයට ඉදිරියෙන් ඇති කොටුව තුළ රෝහලට ඇතුළත් වීමේදී ලබා දෙන අංකය (Admission Number) සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| අංකය | B 859575 |

මව දරු ප්‍රසූතිය සඳහා රෝහලට ඇතුළත් කළ වර්ෂය, මාසය, දිනය සඳහන් කරන්න.

වර්ෂය - ඉලක්කම් හතරක් සහිතව සම්පූර්ණ කළ යුතු ය. උදා :- 2026
මාසය - ඉලක්කම් දෙකක් සහිතව සම්පූර්ණ කළ යුතු ය. උදා :- 01,02,......,10,11,12 ලෙස
දිනය - ඉලක්කම් දෙකක් සහිතව සම්පූර්ණ කළ යුතු ය. උදා :- 01,02,10,11,12 ලෙස

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| වර්ෂය | 2 | 0 | 2 | 6 | මාසය | 0 | 1 | දිනය | 0 | 1 |

**විවාහයේ විස්තර** - දැනුම් දෙන්නා විසින් සම්පූර්ණ කළ යුතු ය.

තොරතුරු සඳහන් කිරීම සඳහා අංක 29 සිට 32 දක්වා වූ කොටුවලින් මෙම කොටස සමන්විත ය.

**අංක 29 - මව්පියන් විවාහකද ('X' ලකුණක් යොදා සටහන් කරන්න)**

'මව්පියන් විවාහකද?' යන්නට ඉදිරියෙන් ඇති කොටු තුළ 'ඔව්', 'නැත','නැත. නමුත් පසුව විවාහ වී ඇත', යන වචන සඳහන් කර ඇති අතර ගැලපෙන පරිදි එම වචනයන්ට ඉදිරියෙන් ඇති කොටුව තුළ 'x' ලකුණ යෙදිය යුතු ය.

දරුවා උපත ලබන දිනට පෙර මව්පියන් විවාහ වී ඇත්නම් 'ඔව්' වචනයට ඉදිරියෙන් ඇති හිස් කොටුව තුළ 'x' ලකුණ යෙදිය යුතු ය.

| | | | |
|---|---|---|---|
| මව්පියන් විවාහක ද? ('x' ලකුණ යොදා සටහන් කරන්න.) | ඔව් [X] | නැත [ ] | නැත. නමුත් පසුව විවාහ වී ඇත [ ] |

දරුවා උපත ලබන දිනට පෙර මව්පියන් විවාහ වී නැත්නම් 'නැත' වචනයට ඉදිරියෙන් ඇති හිස් කොටුව තුළ 'x' ලකුණ යෙදිය යුතු ය.

| | | | |
|---|---|---|---|
| මව්පියන් විවාහක ද? ('x' ලකුණ යොදා සටහන් කරන්න.) | ඔව් [ ] | නැත [X] | නැත. නමුත් පසුව විවාහ වී ඇත [ ] |

දරුවා උපත ලබන දිනට පෙර මව්පියන් විවාහ වී නොමැති විටෙක හා එහෙත් උපත ලියාපදිංචි කිරීම සඳහා විස්තර ආකෘතිය ඉදිරිපත් කරන දින වන විට මව්පියන් විවාහ වී ඇත්නම් 'නැත. නමුත් පසුව විවාහ වී ඇත' වචනයට ඉදිරියෙන් ඇති හිස් කොටුව තුළ 'X' ලකුණ යෙදිය යුතු ය.

| | | | |
|---|---|---|---|
| මව්පියන් විවාහක ද? ('x' ලකුණ යොදා සටහන් කරන්න.) | ඔව් [ ] | නැත [ ] | නැත. නමුත් පසුව විවාහ වී ඇත [X] |

**<u>අංක 30 - විවාහ වූ ස්ථානය</u>**

'විවාහ වූ ස්ථානය' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ මව්පියන්ගේ විවාහ සහතිකය අනුව විස්තර සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| විවාහ වූ ස්ථානය | ග්‍රෑන්ඩ් සිටි, කොළඹ 07 |

**<u>අංක 31- විවාහ වූ දිනය</u>**

'විවාහ වූ දිනය' යන්නට ඉදිරියෙන් ඇති හිස් කොටු තුළ පහත පරිදි විස්තර ඇතුළත් කළ යුතු ය.

වර්ෂය - ඉලක්කම් හතරක් සහිතව සම්පූර්ණ කළ යුතු ය. උදා :- 2023
මාසය - ඉලක්කම් දෙකක් සහිතව සම්පූර්ණ කළ යුතු ය. උදා :-01,02,10,11,12 ලෙස
දිනය - ඉලක්කම් දෙකක් සහිතව සම්පූර්ණ කළ යුතු ය. උදා :-01,02,.......10,11,12 ලෙස

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| වර්ෂය | 2 | 0 | 2 | 3 | මාසය | 0 | 1 | දිනය | 0 | 1 |

**<u>අංක 32 - මව්පියන් විවාහ වී නොමැති නම් පියාගේ තොරතුරු ඇතුළත් කර ගැනීම සඳහා මවගේ සහ පියාගේ අත්සන්</u>**

දරුවා උපත ලබන දිනට පෙර මව්පියන් විවාහ වී නොමැති විටෙක හා උපත ලියාපදිංචියට "උපතක් ලියාපදිංචි කිරීම සඳහා විස්තර" ආකෘතිය ඉදිරිපත් කරන දින වන විට ද මව්පියන් විවාහ වී නොමැති විටෙක, එහෙත් උප්පැන්න සහතිකයේ පියාගේ තොරතුරු ඇතුළත් කර ගැනීමට 'පියා' යයි සැලකෙන තැනැත්තා කැමති නම් මව හා පියා යන දෙදෙනාම තානාපති හෝ කොන්සල් නිලධාරියා ඉදිරියේ දී අදාළ පරිදි කොටුවල අත්සන් යෙදිය යුතු ය.

| මව්පියන් විවාහ වී නොමැති නම් පියාගේ තොරතුරු ඇතුළත් කර ගැනීම සඳහා මවගේ සහ පියාගේ අත්සන් | | | |
|---|---|---|---|
| මවගේ අත්සන | | පියාගේ අත්සන | |

**මුත්තා(දරුවාගේ සීයා)ගේ/ මී මුත්තා(දරුවාගේ සීයාගේ පියා)ගේ විස්තර** - දැනුම්දෙන්නා විසින් සම්පූර්ණ කළ යුතු ය.

තොරතුරු සඳහන් කිරීම සඳහා අංක 33 සිට 34 දක්වා වූ කොටුවලින් මෙම කොටස සමන්විත ය.

**<u>අංක 33 - ළමයාගේ මුත්තා ශ්‍රී ලංකාවේ උපන්නේ නම්</u>**

උපත ලියාපදිංචියට “උපතක් ලියාපදිංචි කිරීම සඳහා විස්තර“ ආකෘතිය ඉදිරිපත් කරන දින වන විට මව්පියන් විවාහ වී ඇති අවස්ථාවක දී, මුත්තාගේ විස්තර ලෙස දරුවාගේ සීයා(පියාගේ පියා)ගේ විස්තර ඇතුළත් කළ හැකි ය. එසේ නොමැති විටෙක, මුත්තාගේ විස්තර ලෙස දරුවාගේ මවගේ පියාගේ විස්තර ඇතුළත් කළ යුතු ය.

‘ඔහුගේ සම්පූර්ණ නම (සිංහල හෝ දෙමළ භාෂාවෙන්)’ යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ ඉහත විස්තරයට අනුව සම්පූර්ණ නම සිංහල හෝ දෙමළ භාෂාවෙන් අදාළ පරිදි ලිවිය යුතු ය.

| | |
|---|---|
| ඔහුගේ සම්පූර්ණ නම (සිංහල හෝ දෙමළ භාෂාවෙන්) | සමරසිංහ අප්පුහාමිලාගේ සයිමන් |
| | සමරසිංහ |
| | |

‘ජාතික හැඳුනුම්පත් අංකය(තිබේ නම්)’ යන්නට ඉදිරියෙන් ඇති කොටු ඇතුළත ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතු ය.

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජාතික හැඳුනුම්පත් අංකය | | | 6 | 9 | 2 | 6 | 5 | 0 | 4 | 5 | 3 | V |

‘ඔහුගේ උපන් වර්ෂය’ යන්නට ඉදිරියෙන් ඇති හිස් කොටු තුළ, වර්ෂය සඳහන් කළ යුතු ය.

| | | | | |
|---|---|---|---|---|
| ඔහුගේ උපන් වර්ෂය | 1 | 9 | 6 | 9 |

ඔහු උපන් ස්ථානය යන්නට ඉදිරියෙන් ඇති හිස් කොටුව තුළ ඔහුගේ උපන් ස්ථානයට අදාළ විස්තර සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| උපන් ස්ථානය | |

**<u>අංක 34 - ළමයාගේ පියා ශ්‍රී ලංකාවේ නොඉපිදී මීමුත්තා ශ්‍රී ලංකාවේ උපන්නේ නම් මී මුත්තාගේ</u>**

උපත ලියාපදිංචියට “උපතක් ලියාපදිංචි කිරීම සඳහා විස්තර” ආකෘතිය ඉදිරිපත් කරන දින වන විට මව්පියන් විවාහ වී ඇති අවස්ථාවක දී පමණක් ‘මී මුත්තාගේ විස්තර’ ලෙස දරුවාගේ පියාගේ සීයාගේ විස්තර ඇතුළත් කළ හැකි ය. එසේ නොමැති විටෙක, මී මුත්තාගේ විස්තර සඳහා මවගේ සීයාගේ විස්තර ඇතුළත් කළ යුතු ය.

‘ඔහුගේ සම්පූර්ණ නම (සිංහල හෝ දෙමළ භාෂාවෙන්)’ යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ ඉහත විස්තරයට අනුව සම්පූර්ණ නම සිංහල හෝ දෙමළ භාෂාවෙන් අදාළ පරිදි ලිවිය යුතු ය.

| | |
|---|---|
| ඔහුගේ සම්පූර්ණ නම (සිංහල හෝ දෙමළ භාෂාවෙන්) | සමරසිංහ අප්පුහාමිලාගේ නෙල්සන් |
| | අප්පුහාමි |

‘ජාතික හැඳුනුම්පත් අංකය’ යන්නට ඉදිරියෙන් ඇති කොටු ඇතුළත ඔහුගේ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතු ය.

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජාතික හැඳුනුම්පත් අංකය | | | 4 | 7 | 2 | 6 | 5 | 0 | 4 | 5 | 3 | V |

‘ඔහුගේ උපන් වර්ෂය’ යන්නට ඉදිරියෙන් ඇති හිස් කොටු තුළ, වර්ෂය සඳහන් කළ යුතු ය.

| | | | | |
|---|---|---|---|---|
| ඔහුගේ උපන් වර්ෂය | 1 | 9 | 4 | 7 |

'උපන් ස්ථානය' යන්නට ඉදිරියෙන් ඇති හිස් කොටුව තුළ ඔහුගේ උපන් ස්ථානයට අදාළ විස්තර සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| උපන් ස්ථානය | |

**දැනුම් දෙන්නාගේ විස්තර** - දැනුම්දෙන්නා විසින් සම්පූර්ණ කළ යුතු ය.

තොරතුරු සඳහන් කිරීම සඳහා අංක 35 සිට 39 දක්වා වූ කොටුවලින් මෙම කොටස සමන්විත ය.

**<u>අංක 35 – දැනුම්දෙන්නේ කවුරුන් විසින් ද?('X' ලකුණක් යොදා සටහන් කරන්න)</u>**

'දැනුම්දෙන්නේ කවරකු විසින් ද?' යන්නට ඉදිරියෙන් ඇති හිස් කොටු තුළ 'මව', ' පියා' හා 'භාරකරු' යන වචන සඳහන් කර ඇති අතර ගැලපෙන පරිදි එම වචනයන්ට ඉදිරියෙන් ඇති හිස් කොටුව තුළ ' x ' ලකුණ යෙදිය යුතු ය.

| | | | | |
|---|---|---|---|---|
| දැනුම්දෙන්නේ කවුරුන් විසින් ද? ('x' ලකුණ යොදා සටහන් කරන්න.) | මව X | පියා | භාරකරු | වෙනත් |

**<u>අංක 36 - ජාතික හැඳුනුම්පත් අංකය</u>**

'ජාතික හැඳුනුම්පත් අංකය' යන්නට ඉදිරියෙන් ඇති කොටු තුළ දැනුම් දෙන්නාගේ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතු ය.

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජාතික හැඳුනුම්පත් අංකය | | | 9 | 9 | 6 | 6 | 5 | 0 | 4 | 5 | 3 | V |

**<u>අංක 37 - නම (සිංහල හෝ දෙමළ භාෂාවෙන්)</u>**

'නම (සිංහල හෝ දෙමළ භාෂාවෙන්)' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ දැනුම් දෙන අයගේ නම සිංහල හෝ දෙමළ භාෂාවෙන් සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| නම (සිංහල හෝ දෙමළ භාෂාවෙන්) | අප්පුහාමිලාගේ අජන්තා කුමාරි |
| | |
| | |

**<u>අංක 38 - තැපැල් ලිපිනය</u>**

'තැපැල් ලිපිනය' යන්නට ඉදිරියෙන් ඇති කොටු තුළ දැනුම්දෙන අයගේ තැපැල් ලිපිනය සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| තැපැල් ලිපිනය | නො.27 |
| | ශාන්ත ලෝරෙන්සෝ ද බ්‍රින්ඩිසි |
| | නාපොලි,ඉතාලිය |

**අංක 39 - සම්බන්ධ කළ හැකි තොරතුරු**

සම්බන්ධ කළ හැකි තොරතුරු ලෙස 'ජංගම දුරකතන අංකය' යන වචනයට ඉදිරියෙන් ඇති කොටුව තුළ දැනුම්දෙන අය සම්බන්ධ කර ගත හැකි ජංගම දුරකථන අංකයක් වේ නම්, එය සඳහන් කළ යුතු ය.

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජංගම දුරකථන අංකය | 0 | 0 | 3 | 9 | 1 | 2 | 3 | 4 | 5 | 6 |

'ස්ථාවර දුරකථන අංකය' යන වචනයට ඉදිරියෙන් ඇති කොටුව තුළ දැනුම් දෙන අය සම්බන්ධ කර ගත හැකි ස්ථාවර දුරකථන අංකයක් වේ නම්, එය සඳහන් කළ යුතු ය.

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ස්ථාවර දුරකථන අංකය | 0 | 7 | 7 | 8 | 2 | 3 | 4 | 5 | 6 | 7 |

'විද්‍යුත් තැපැල' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ දැනුම්දෙන අය සම්බන්ධ කර ගත හැකි විද්‍යුත් තැපැල් ලිපිනයක් ඇත්නම් (e-mail address) සඳහන් කළ යුතු ය.

** සම්බන්ධ කර ගත හැකි තොරතුරුවලට පහළින් ඇති දිනය හා අත්සන යෙදීමට ඇති ස්ථානයේ දැනුම්දෙන්නාගේ අත්සන යෙදිය යුතු අතර අත්සන යොදනු ලබන දිනය අදාළ ස්ථානයේ ලිවිය යුතු ය.

ඉහත සඳහන් විස්තර සත්‍යවූත් නිවැරදි වූත් විස්තර බවත්, සාවද්‍ය තොරතුරු සැපයීමෙන් ඇතිවන නීතිමය ගැටළු සම්බන්ධයෙන් සියලු වගකීම් මා බාර ගන්නා බවත් මෙයින් ප්‍රකාශ කරමි.

.............................. ........................................................

දිනය දැනුම් දෙන්නාගේ අත්සන

**තොරතුරු වාර්තා කරන නිලධාරියාගේ /රෙජිස්ට්‍රාර්ගේ විස්තර** - තානාපති හෝ කොන්සල් නිලධාරියා විසින් සම්පූර්ණ කළ යුතු ය.

තොරතුරු සඳහන් කිරීම සඳහා අංක 40 සිට 42 දක්වා වූ කොටුවලින් මෙම කොටස සමන්විත ය. තොරතුරු වාර්තා කිරීම සඳහා භාරගත් තැනැත්තාගේ තානාපති හෝ කොන්සල් නිලධාරියාගේ විස්තර සඳහන් කළ යුතු ය.

**අංක 40 - ජාතික හැඳුනුම්පත් අංකය**

'ජාතික හැඳුනුම්පත් අංකය' යන්නට ඉදිරියෙන් ඇති කොටු ඇතුළත තානාපති හෝ කොන්සල් නිලධාරියාගේ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතු ය.

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජාතික හැඳුනුම්පත් අංකය | | | 9 | 5 | 5 | 6 | 3 | 6 | 4 | 5 | 3 | V |

**අංක 41- නම (සිංහල හෝ දෙමළ භාෂාවෙන්)**

'නම (සිංහල හෝ දෙමළ භාෂාවෙන්)'යන වචනයට ඉදිරියෙන් ඇති කොටුව තුළ තානාපති හෝ කොන්සල් නිලධාරියාගේ නම සිංහල හෝ දෙමළ භාෂාවෙන් සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| නම (සිංහල හෝ දෙමළ භාෂාවෙන්) | මහේෂ් ක්‍රිශාන්ත පෙරේරා |
| | |
| | |

අංක 42- තැපැල් ලිපිනය

'තැපැල් ලිපිනය' යන්නට ඉදිරියෙන් ඇති කොටු තුළ තානාපති හෝ කොන්සල් නිලධාරියාගේ තානාපති කාර්යාල තැපැල් ලිපිනය සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| තැපැල් ලිපිනය | ශ්‍රී ලංකා තානාපති කාර්යාලය |
| | ප්‍රධාන විදිය, |
| | රෝමය,ඉතාලිය |

** තැපැල් ලිපිනය සඳහන් කොටුවට පහළින් ඇති කොටුවේ "උපත් විස්තර පත්‍රිකාව" ලියාපදිංචිය සඳහා භාර දෙන ලද තැනැත්තාගේ නම සඳහන් කළ යුතු ය. පහළින් අත්සන යෙදීමට ඇති ස්ථානයේ තානාපති හෝ කොන්සල් නිලධාරියා අත්සන යොදා නිල මුද්‍රාව තැබිය යුතු ය. අදාළ ස්ථානයේ දිනය සඳහන් කළ යුතු ය.

........................................................... යන අයගෙන් ලද උපතක් ලියාපදිංචි කිරීම සඳහා විස්තර පත්‍රිකාව, සිවිල් ලියාපදිංචි කිරීමේ පද්ධතියේ ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරමි.

................................ ..............................................................................

දිනය නිලධාරියාගේ / රෙජිස්ට්‍රාර්ගේ අත්සන හා නිල මුද්‍රාව

**කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණි** - සිවිල් ලියාපදිංචි කිරීමේ පද්ධතියට තොරතුරු ඇතුළත් කරනු ලබන නිලධාරිය විසින් සම්පූර්ණ කළ යුතු ය.

*'ඉහත සඳහන් තොරතුරු සිවිල් ලියාපදිංචි කිරීමේ පද්ධතියට ඇතුළත් කරන ලදී' යන්නට ඉදිරියෙන් ඇති 'නම' යන කොටුවට ඉදිරියෙන් සිවිල් ලියාපදිංචි කිරීමේ පද්ධතියට තොරතුරු ඇතුළත් කරනු ලබන නිලධාරියාගේ නම සඳහන් කළ යුතු ය.

*'තනතුර' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ නිලධාරියාගේ තනතුර සඳහන් කළ යුතු ය.

*'අත්සන' හා 'දිනය' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ සිවිල් ලියාපදිංචි කිරීමේ පද්ධතියට තොරතුරු ඇතුළත් කරනු ලබන නිලධාරියාගේ අත්සන හා තොරතුරු දත්ත පද්ධතියට ඇතුළත් කරනු ලැබූ දිනය සඳහන් කළ යුතු ය.

## මරණ ප්‍රකාශය - සාමාන්‍ය හා හදිසි මරණ (මරණයක් ලියාපදිංචි කිරීම සඳහා විස්තරය) - CR02 ආකෘතිය සම්පූර්ණ කිරීම සඳහා මඟපෙන්වීම

**අනුක්‍රමික අංකය** - තානාපති හෝ කොන්සල් නිලධාරියා විසින් සම්පූර්ණ කළ යුතු ය.

දකුණු පස ඉහළ කෙළවරෙහි ඉලක්කම් 10 ක් යොදා සම්පූර්ණ කිරීම සඳහා හිස් කොටු සහිතව මුද්‍රණය කර ඇත. එම් පස සිට අංක කිරීම ආරම්භ කරන්න.

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

එම කොටුවලින් පළමු කොටු හතරෙහි වර්ෂය සඳහන් කළ යුතු ය.

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2 | 0 | 2 | 6 | | | | | | |

පස්වන කොටුවෙහි ආකෘතිය ලියාපදිංචි කිරීම සඳහා භාරගන්නා හඳුනා ගැනීමේ සංකේත අංකය සඳහන් කළ යුතු ය.
ආකෘතිය භාරගනු ලබන්නේ තානාපති හෝ කොන්සල් නිලධාරියා විසින් බැවින් 1 ලෙස සඳහන් කළ යුතු ය.

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2 | 0 | 2 | 6 | 0 | | | | | |

සයවන කොටුවේ සිට දහවන කොටුව දක්වා වූ කොටුවල, ආකෘති පත්‍රයට අදාළ වන අනුක්‍රමික වශයෙන් ලැබෙන අංකය සඳහන් කළ යුතු ය. එම අංකය **සෑම වර්ෂයකදීම** 00001න් ආරම්භ කර 00002,00003...............ආදී වශයෙන් අනුක්‍රමික අංක පිළිවෙළින් අංක කළ යුතු ය.

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2 | 0 | 2 | 6 | 0 | 0 | 0 | 0 | 0 | 1 |

තානාපති හෝ කොන්සල් නිලධාරියා විසින් CR02 ආකෘතිය දැනුම් දෙන්නාගෙන් භාරගත් දිනය, අනුක්‍රමික අංකයට පහළින් කාර්යාල ප්‍රයෝජනය සඳහා වෙන් කර ඇති කොටුවෙහි සටහන් කළ යුතු ය.

CR02 ආකෘතියට අනුව අතින් ලියා නිකුත් කර ඇති මරණ සහතිකයේ අංකය හා එය ලියාපදිංචි කිරීමේ දිනය එම්පස ඉහළ කෙළවරේ ඇති කොටුව තුළ සටහන් කරන්න. එසේම CR02 ආකෘතිය භාරගත් අනුපිළිවෙළ අනුව මරණ සහතික ලියාපදිංචි කළ යුතු ය.

**මරණය පිළිබඳ විස්තර** - දැනුම්දෙන්නා විසින් සම්පූර්ණ කළ යුතු ය.

තොරතුරු සඳහන් කිරීම සඳහා අංක 1 සිට 7 දක්වා වූ කොටුවලින් මෙම කොටස සමන්විතය.

**<u>අංක 01 - මරණයේ ස්වභාවය</u>**

'මරණයේ ස්වභාවය' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ ඇති 'සාමාන්‍ය මරණයකි/ හදිසි මරණයකි' යන වචනය අතුරින් සුදුසු වචනය ඉතිරි කර, අනවශ්‍ය වචන කපා හරින්න.

| | |
|---|---|
| මරණයේ ස්වභාවය | සාමාන්‍ය මරණයකි / හදිසි මරණයකි |

**<u>අංක 02 - මරණය සිදු වූ දිනය</u>**

'මරණය සිදු වූ දිනය' යන්නට ඉදිරියෙන් ඇති කොටු තුළ,

වර්ෂය - ඉලක්කම් හතරක් සහිතව සම්පූර්ණ කළ යුතු ය. උදා :- 2025
මාසය - ඉලක්කම් දෙකක් සහිතව සම්පූර්ණ කළ යුතු ය. උදා :- 01,02,....,10,11,12 ලෙස
දිනය - ඉලක්කම් දෙකක් සහිතව සම්පූර්ණ කළ යුතු ය. උදා:-01,02,.......10,11,12 ලෙස සඳහන් කළ යුතු ය.

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මරණය සිදු වූ දිනය | වර්ෂය | 2 | 0 | 2 | 5 | මාසය | 1 | 2 | දිනය | 2 | 6 |

'මරණය සිදු වූ වේලාව' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ පෙරවරු හෝ පස්වරු යන වචනවලින් සුදුසු වචනය ඉතිරි කර අනවශ්‍ය වචන කපා දමා වේලාව සුදුසු පරිදි සටහන් කළ යුතු ය.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| වේලාව | පෙ.ව./ ප.ව. | | | | | |

**<u>අංක 03 - මරණය සිදු වූ ස්ථානය පිළිබඳ විස්තර</u>**

'මරණය සිදු වූ ස්ථානය පිළිබඳ විස්තර' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ දිස්ත්‍රික්කය ලෙස 'කොළඹ කන්සියුලර්' යන්න සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| දිස්ත්‍රික්කය | කොළඹ කන්සියුලර් |

'ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ මරණය සිදු වූ ස්ථානය අයත් වන රට සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉතාලිය |

'ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ මරණය සිදු වූ ස්ථානය අයත් වන තානාපති කාර්යාලය පිළිබඳ සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය | රෝමය |

'ස්ථානය' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ සිංහල හෝ දෙමළ භාෂාවෙන් සහ ඉංග්‍රීසි භාෂාවෙන් මරණය සිදු වූ ස්ථානය පිළිබඳ සඳහන් කළ යුතු ය.

| | | |
|---|---|---|
| ස්ථානය | සිංහල හෝ දෙමළ භාෂාවෙන් | මෙඩිසි රෝහල,නාපොලි |
| | ඉංග්‍රීසි භාෂාවෙන් | MEDIZI HOSPITAL,NAPOLI |

'මරණය සිදු වූයේ රෝහලක් තුළද?'යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ ඇති 'ඔව්' සහ 'නැත' යන වචනවලින් අනවශ්‍ය වචනය කපා දැමිය යුතු ය.

| | |
|---|---|
| මරණය සිදු වූයේ රෝහලක් තුළ ද? | ඔව්/~~නැත~~ |

**<u>අංක 04 - මරණයට හේතුව තහවුරු වී ඇත/ මරණයට හේතුව තහවුරු වී නැත.</u>**

'මරණයට හේතුව තහවුරු වී ඇත/ මරණයට හේතුව තහවුරු වී නැත' යන වචනවලින් සුදුසු වචනය ඉතිරි කර අනවශ්‍ය වචනය කපා දැමිය යුතු ය.

| |
|---|
| මරණයට හේතුව තහවුරු වී ඇත./ මරණයට හේතුව තහවුරු වී නැත. |

**<u>අංක 05 - මරණයට හේතුව (දන්නේ නම් පමණක්)</u>**

'මරණයට හේතුව' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ රෝහලකින් නිකුත් කර ඇති මරණයට හේතුව පිළිබඳව සහතිකය අනුව හෝ වෛද්‍යවරයෙකු/හදිසි මරණ පරීක්ෂකවරයෙකු විසින් නිකුත් කර ඇති සහතිකයක සඳහන් පරිදි හෝ වෙනත් ආකාරයේ දැන්වීමක් පරිදි මරණයට හේතුව දන්නේ නම්, එම හේතුව සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| මරණයට හේතුව (දන්නේ නම් පමණක්) | |

**<u>අංක 06 - හේතුවේ ICD කේත අංකය (දන්නේ නම් පමණක්)</u>**

'හේතුවේ ICD කේත අංකය' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ මරණයේ හේතුවට අදාළ වන අන්තර්ජාතික රෝග වර්ගීකරණ ලැයිස්තු අංකය දන්නේ නම් පමණක්, සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| හේතුවේ ICD කේත අංකය (දන්නේ නම් පමණක්) | |

**<u>අංක 07 - ආදාහනය හෝ භූමිදානය කරන ලද ස්ථානය</u>**

'ආදාහනය හෝ භූමිදානය කරන ලද ස්ථානය' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ මියගිය අය ආදාහනය හෝ භූමිදානය කර ඇත්නම්, එම ස්ථානය සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| ආදාහනය හෝ භූමිදානය කරන ලද ස්ථානය | |

**මරණයට පත් වූ පුද්ගලයාගේ විස්තර** - තොරතුරු සඳහන් කිරීම සඳහා දැනුම්දෙන්නා විසින් සම්පූර්ණ කළ යුතු ය.

අංක 08 සිට 23 දක්වා වූ කොටුවලින් මෙම කොටස සමන්විත ය.

**<u>අංක 08 - මිය ගිය පුද්ගලයා හඳුනාගෙන තිබේ./ මියගිය පුද්ගලයා හඳුනාගෙන නැත.</u>**

'මිය ගිය පුද්ගලයා හඳුනාගෙන තිබේ / මියගිය පුද්ගලයා හඳුනාගෙන නැත' යන වචනවලින් සුදුසු වචනය ඉතිරි කර, අනවශ්‍ය වචනය කපා දැමිය යුතු ය.

| |
|---|
| මිය ගිය පුද්ගලයා හඳුනාගෙන තිබේ. / මියගිය පුද්ගලයා හඳුනාගෙන නැත. |

**<u>අංක 09 - ශ්‍රී ලාංකිකයෙකු නම්, ජාතික හැඳුනුම්පත් අංකය, ගමන් බලපත්‍ර අංකය</u>**

'ශ්‍රී ලාංකිකයෙකු නම්' යන්නට ඉදිරියෙන් ඇති හිස් කොටුව ඇතුළත මියගිය පුද්ගලයාගේ ජාතික හැඳුනුම්පත් අංකය හෝ ගමන් බලපත්‍ර අංකය සඳහන් කළ යුතු ය.

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ශ්‍රී ලාංකිකයෙකු නම්, | ජාතික හැඳුනුම්පත් අංකය | | | 5 | 9 | 2 | 6 | 5 | 0 | 4 | 5 | 3 | V |

**අංක 10 – විදේශිකයෙකු නම්, (විදේශිකයෙකු සඳහා මරණ සහතිකයක් නිකුත් නොකරන බැවින්,මෙම තීරයට තොරතුරු ඇතුළත් කිරීම අවශ්‍යා නොවේ)**

'රට' යන වචනයට ඉදිරියෙන් ඇති කොටුව තුළ මියගිය පුද්ගලයාගේ ගමන් බලපත්‍රයේ සඳහන් කර ඇති රට පිළිබඳ විස්තර සඳහන් කළ යුතු ය.

'ගමන් බලපත්‍ර අංකය' යන්නට ඉදිරියෙන් ඇති කොටු තුළ මියගිය පුද්ගලයාගේ ගමන් බලපත්‍රයේ සඳහන් කර ඇති අංකය පිළබඳ විස්තර සඳහන් කළ යුතු ය.

| විදේශිකයෙකු නම්, | රට | ඉතාලිය | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | විදේශ ගමන් බලපත්‍ර අංකය | | | | | | | | | | | | |

**අංක 11 – උපන් දිනය**

'උපන් දිනය' යන්නට ඉදිරියෙන් ඇති කොටු තුළ, මියගිය පුද්ගලයාගේ උප්පැන්න සහතිකය අනුව,

වර්ෂය - ඉලක්කම් හතරක් සහිතව සම්පූර්ණ කළ යුතු ය. උදා :- 1959

මාසය - ඉලක්කම් දෙකක් සහිතව සම්පූර්ණ කළ යුතු ය. උදා :- 01,02,10,11,12 ලෙස

දිනය - ඉලක්කම් දෙකක් සහිතව සම්පූර්ණ කළ යුතු ය. උදා :- 01,02,10,11,12 ලෙස

| උපන් දිනය | වර්ෂය | | | | | මාසය | | | දිනය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 9 | 5 | 9 | | 0 | 1 | | 0 | 1 |

**අංක 12 - වයස**

'වයස' යන වචනයට ඉදිරියෙන් ඇති කොටු තුළ, මියගිය පුද්ගලයාගේ වයස සඳහන් කළ යුතු ය.
උපන් දිනය නිවැරදිව දන්නේ නම්, වයස අවුරුදු, මාස සහ දින ගණනින් දක්වන්න.
උපන් දිනය නිවැරදිව නොදන්නේ නම්, වයස අවුරුදු ගණනින් හෝ, මාස ගණනින් හෝ දින ගණනින් දක්වන්න. (වයස මාස 12 ක් සම්පූර්ණ වී හෝ ඊට වැඩි නම් අවුරුදු ගණනින්ද, වයස මාස 12 ක් සම්පූර්ණ වී නොමැති සහ දින 31 ට වැඩි නම් මාස ගණනින්ද, වයස දින 31 අඩු නම් දින ගණනින්ද වයස සඳහන් කළ යුතු ය.)

| වයස | අවුරුදු | | 6 | 6 | මාස | 1 | 1 | දින | 2 | 5 |
|---|---|---|---|---|---|---|---|---|---|---|

**අංක 13 - ජාතිකත්වය**

'ජාතිකත්වය' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ මියගිය පුද්ගලයා ශ්‍රී ලාංකිකයෙකු බැවින්, 'ශ්‍රී ලාංකික' යනුවෙන් සඳහන් කළ යුතු ය.

| ජාතිකත්වය | ශ්‍රී ලාංකික |
|---|---|

මියගිය පුද්ගලයා විදේශිකයෙකු නම්, ඔහු උපන් රට අනුව ජාතිකත්වය සඳහන් කළ යුතු ය(**අදාළ නොවන බැවින් මෙම තීරයට තොරතුරු ඇතුළත් කිරීම අවශ්‍යා නොවේ**).

| ජාතිකත්වය | ඉතාලි ජාතික |
|---|---|

**අංක 14- ස්ත්‍රී පුරුෂ භාවය**

'ස්ත්‍රී පුරුෂ භාවය' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ අදාළ වචනය ලිවිය යුතු ය.

| ස්ත්‍රී පුරුෂ භාවය | පුරුෂ |
|---|---|

**<u>අංක 15 - ජාතිය</u>**

'ජාතිය' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ මියගිය පුද්ගලයා ශ්‍රී ලාංකිකයෙකු බැවින් ඔහුගේ/ඇයගේ උප්පැන්න සහතිකය අනුව ජනවර්ගය සඳහන් කළ යුතු ය(උදා: සිංහල, ශ්‍රී ලංකා දෙමළ, ඉන්දියානු දෙමළ ආදි වශයෙන්).

| | |
|---|---|
| ජාතිය | සිංහල |

මියගිය පුද්ගලයා විදේශිකයෙකු නම්, ඔහු උපන් රට අනුව විස්තර සඳහන් කළ යුතු ය(**අදාළ නොවන බැවින්මෙම තීරයට තොරතුරු ඇතුළත් කිරීම අවශ්‍ය නොවේ**).

| | |
|---|---|
| ජාතිය | ඉන්දියානු |

**<u>අංක 16 - සම්පූර්ණ නම (සිංහල හෝ දෙමළ භාෂාවෙන්)</u>**

'සම්පූර්ණ නම (සිංහල හෝ දෙමළ භාෂාවෙන්)' යන්නට ඉදිරියෙන් ඇති තීරුවල මියගිය පුද්ගලයාගේ සම්පූර්ණ නම සිංහල හෝ දෙමළ භාෂාවෙන් ලිවිය යුතු ය.

| | |
|---|---|
| සම්පූර්ණ නම (සිංහල හෝ දෙමළ භාෂාවෙන්) | වීරසිංහ ආරච්චිගේ ගයාන් නිමන්ත |
| | යසස් |

**<u>අංක 17 - සම්පූර්ණ නම ඉංග්‍රීසි භාෂාවෙන්</u>**

'සම්පූර්ණ නම ඉංග්‍රීසි භාෂාවෙන්' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ සම්පූර්ණ නම ඉංග්‍රීසි කැපිටල් අකුරින් ලිවිය යුතු ය.දැනුම් දෙන්නාට ඉංග්‍රීසි භාෂාවෙන් නම ලිවිය නොහැකි නම්, එම ස්ථානය හිස්ව තැබිය යුතු ය.

| | |
|---|---|
| සම්පූර්ණ නම ඉංග්‍රීසි භාෂාවෙන් (කැපිටල් අකුරින්) | WEERASINGHE ARACHCHIGE GAYAN |
| | NIMANTHA YASAS |

**<u>අංක 18- ස්ථිර ලිපිනය</u>**

මියගිය පුද්ගලයාගේ ස්ථිර පදිංචි ලිපිනය සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| ස්ථිර ලිපිනය | නො.581 |
| | ෆෙරන්සි ආකේඩ් |
| | නාපොලි |

'දිස්ත්‍රික්කය' යන වචනයට ඉදිරියෙන් ඇති කොටුව තුළ මියගිය පුද්ගලයාගේ ස්ථිර පදිංචි ලිපිනය අයත් වන නගරයේ නම සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| දිස්ත්‍රික්කය | රෝමය |

**මෙම කොටසට තොරතුරු ඇතුළත් කිරීම අවශ්‍ය නොවේ.**

'ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ මියගිය පුද්ගලයාගේ ස්ථිර පදිංචි ලිපිනය අයත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | |

'ග්‍රාම නිලධාරි කොට්ඨාසය හා අංකය' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ මියගිය පුද්ගලයාගේ ස්ථිර පදිංචි ලිපිනය අයත් වන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නම සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| ග්‍රාම නිලධාරි කොට්ඨාසය හා අංකය | |

**<u>අංක 19- තත්ත්වය නොහොත් වෘත්තීය</u>**

'තත්ත්වය නොහොත් වෘත්තීය' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ මියගිය පුද්ගලයාගේ ස්ථිර රැකියාවට අදාළව තත්ත්වය නොහොත් වෘත්තිය සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| තත්ත්වය නොහොත් වෘත්තීය | වෛද්‍ය |

එයට ඉදිරියෙන් ඇති කොටුව තුළ ඇති 'විශ්‍රාම වැටුප් ලාභියෙකි/ විශ්‍රාම වැටුප් ලාභියෙක් නොවේ' යන වචනවලින් අනවශ්‍ය වචනය කපා දැමිය යුතු ය. මිය ගිය පුද්ගලයා ශ්‍රී ලංකා රජයේ විශ්‍රාම වැටුප් ලාභියෙක් නම් පමණක් 'විශ්‍රාම වැටුප් ලාභියෙකි' යන වචනය ඉතිරි කරන්න.

| |
|---|
| විශ්‍රාම වැටුප් ලාභියෙකි/ විශ්‍රාම වැටුප් ලාභියෙක් නොවේ. |

'විශ්‍රාම වැටුප් ලාභියෙකි' යන උද්ධෘතය තෝරා ගත් විට, පහතින් ඇති කොටුව තුළ විශ්‍රාම වැටුප් අංකය සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| විශ්‍රාම වැටුප් ලාභියෙක් නම් විශ්‍රාම වැටුප් අංකය | |

**<u>අංක 20 - පියාගේ ජාතික හැඳුනුම්පත් අංකය(තිබේ නම් පමණක්)</u>**

මියගිය පුද්ගලයාගේ 'පියාගේ ජාතික හැඳුනුම්පත් අංකය' යන්නට ඉදිරියෙන් ඇති හිස් කොටු ඇතුළත පියාගේ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතු ය.

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පියාගේ ජාතික හැඳුනුම්පත් අංකය | | | 3 | 6 | 2 | 6 | 5 | 0 | 4 | 5 | 3 | V |

**<u>අංක 21 - පියාගේ සම්පූර්ණ නම</u>**

මියගිය පුද්ගලයාගේ 'පියාගේ සම්පූර්ණ නම' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ පියාගේ සම්පූර්ණ නම සිංහල හෝ දෙමළ භාෂාවෙන් ලිවිය යුතු ය.

| | |
|---|---|
| සම්පූර්ණ නම (සිංහල හෝ දෙමළ භාෂාවෙන්) | වීරසිංහ ආරච්චිගේ පොඩි බණ්ඩා |
| | සමරසිංහ |
| | |

**<u>අංක 22 - මවගේ ජාතික හැඳුනුම්පත් අංකය(තිබේ නම් පමණක්)</u>**

'මියගිය පුද්ගලයාගේ මවගේ ජාතික හැඳුනුම්පත් අංකය' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ මවගේ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතු ය.

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ශ්‍රී ලාංකිකයෙකු නම්, | ජාතික හැඳුනුම්පත් අංකය | | | 3 | 8 | 6 | 6 | 5 | 0 | 4 | 5 | 3 | V |

**<u>අංක 23 - මවගේ සම්පූර්ණ නම</u>**

මියගිය පුද්ගලයාගේ 'මවගේ සම්පූර්ණ නම' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ මවගේ සම්පූර්ණ නම සිංහල හෝ දෙමළ භාෂාවෙන් ලිවිය යුතු ය.

| | |
|---|---|
| මවගේ සම්පූර්ණ නම (සිංහල හෝ දෙමළ භාෂාවෙන්) | අප්පුහාමිලාගේ නයනා කුමාරි |
| | |
| | |

**<u>අංක 24 - මියගියේ වයස අවු 49 අඩු කාන්තාවක් නම් පමණක් මෙම කොටස සම්පූර්ණ කළ යුතු ය.</u>**

'මරණයට පත්වන විට ඇය දරුවකු ලැබීමට සිටියේද?' යන්නට ඉදිරියෙන් ඇති 'ඔව්/නැත' යන වචනවලින් සුදුසු වචනය ඉතිරි කර, අනවශ්‍ය වචනය කපා දැමිය යුතු ය.

| |
|---|
| මරණයට පත්වන විට ඇය දරුවකු ලැබීමට සිටියේද? ඔව්/නැත. |

'මරණයට පෙර සති 6ක් (දින 42ක්) ඇතුළත දී ඇය විසින් දරුවකු ප්‍රසූත කර ඇත/ නැත' යන වචනවලින් සුදුසු වචනය ඉතිරි කර, අනවශ්‍ය වචනය කපා දැමිය යුතු ය.

| |
|---|
| මරණයට පෙර සති 6ක් (දින 42ක්) ඇතුළත දී ඇය විසින් දරුවකු ප්‍රසූත කර ඇත/ නැත |

'නැතහොත් ගබ්සාවක් සිදු වී ඇත/නැත' යන වචනවලින් සුදුසු වචනය ඉතිරි කර, අනවශ්‍ය වචනය කපා දැමිය යුතු ය.

| |
|---|
| නැතහොත් ගබ්සාවක් සිදු වී ඇත/ නැත |

'දරු ප්‍රසූතිය හෝ ගබ්සාව සිදුවූයේ මරණය සිදු වීමට දින කීයකට පෙරද?' යන්නට ඉදිරියෙන් ඇති හිස් කොටු තුළ දින ගණන සඳහන් කළ යුතු ය.

| | | |
|---|---|---|
| දරු ප්‍රසූතිය හෝ ගබ්සාව සිදුවූයේ මරණය සිදු වීමට දින කීයකට පෙරද? | | |

**දැනුම් දෙන්නාගේ විස්තර** - දැනුම්දෙන්නා විසින් සම්පූර්ණ කළ යුතු ය.

තොරතුරු සඳහන් කිරීම සඳහා අංක 25 සිට 29 දක්වා වූ කොටුවලින් මෙම කොටස සමන්විත ය.

**අංක 25 - දැනුම්දෙන්නේ කවරකු වශයෙන්ද? (‘X’ ලකුණක් යොදා සටහන් කරන්න)**

‘දැනුම්දෙන්නේ කවරකු වශයෙන් ද?’ යන්නට ඉදිරියෙන් ඇති හිස් කොටු තුළ “පියා/මව”, “ස්වමිපුරුෂයා/භාර්යාව”, “සහෝදරයා/සහෝදරිය”, “පුත්‍රයා/ දියණිය”, “නැයන්” සහ “වෙනත්” යන වචන සඳහන් කර ඇති අතර ගැලපෙන පරිදි එම වචනයන්ට ඉදිරියෙන් ඇති හිස් කොටුව තුළ 'X' ලකුණ යෙදිය යුතු ය.

| | | | |
|---|---|---|---|
| දැනුම්දෙන්නේ කවරකු වශයෙන්ද (x ලකුණක් යොදා සටහන් කරන්න) | පියා/මව ☐ | ස්වාමිපුරුෂයා/භාර්යාව X | සහෝදරයා/සහෝදරිය ☐ |
| | පුත්‍රයා/ දියණිය ☐ | නැයන් ☐ | වෙනත් ☐ |

**අංක 26 - ජාතික හැඳුනුම්පත් අංකය(තිබේ නම් පමණක්)**

‘ජාතික හැඳුනුම්පත් අංකය’ යන්නට ඉදිරියෙන් ඇති කොටු තුළ දැනුම් දෙන්නාගේ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතු ය.

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජාතික හැඳුනුම්පත් අංකය | | | 6 | 9 | 2 | 6 | 5 | 0 | 4 | 5 | 3 | V |

**අංක 27 - සම්පූර්ණ නම**

‘සම්පූර්ණ නම’යන වචනයට ඉදිරියෙන් ඇති කොටුව තුළ දැනුම්දෙන අයගේ සම්පූර්ණ නම සිංහල හෝ දෙමළ භාෂාවෙන් සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| සම්පූර්ණ නම (සිංහල හෝ දෙමළ භාෂාවෙන්) | රන්දෙනිගල ගෙදර සීතා කුමාරි |
| | පෙරේරා |
| | |

**අංක 28- තැපැල් ලිපිනය**

‘තැපැල් ලිපිනය’ යන්නට ඉදිරියෙන් ඇති කොටු තුළ දැනුම්දෙන අයගේ තැපැල් ලිපිනය සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| තැපැල් ලිපිනය | නො.542 |
| | ෆෙරන්සි ආකේඩ් |
| | නාපොලි |

**අංක 29 - ඇමතුම් විස්තර**

‘ඇමතුම් විස්තර’ යන්නට ඉදිරියෙන් ‘ජංගම දුරකතන අංකය’ යන වචනයට ඉදිරියෙන් ඇති කොටුව තුළ දැනුම්දෙන අය සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකයක් වේ නම්, එය සඳහන් කළ යුතු ය.

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජංගම දුරකථන අංකය | 0 | 7 | 2 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |

‘ස්ථාවර දුරකථන අංකය’ යන වචනයට ඉදිරියෙන් ඇති කොටුව තුළ දැනුම් දෙන අය සම්බන්ධ කර ගත හැකි ස්ථාවර දුරකථන අංකයක් වේ නම්, එය සඳහන් කළ යුතු ය.

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ස්ථාවර දුරකථන අංකය | 0 | 3 | 5 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |

'විද්‍යුත් තැපැල' යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ දැනුම්දෙන අය සම්බන්ධ කර ගත හැකි විද්‍යුත් තැපැල් ලිපිනයක් ඇත්නම් එය (e-mail address) සඳහන් කළ යුතු ය.

**හදිසි මරණයක් නම් - හදිසි මරණ පරීක්ෂක හෝ අධිකරණ වෛද්‍ය නිලධාරීගේ විස්තර**
(අදාළ වේ නම් පමණක් ඇතුළත් කරන්න)

තොරතුරු සඳහන් කිරීම සඳහා අංක 30 සිට 33 දක්වා වූ කොටුවලින් මෙම කොටස සමන්විත ය.

අදාළ මරණය හදිසි මරණයක් නම් පමණක්, මෙම කොටසෙහි විස්තර ඇතුළත් කළ යුතු ය. මෙම කොටසෙහි සඳහන් කළ යුත්තේ "මරණ පරීක්ෂක තැනගේ සහතිකය (ලියාපදිංචි කිරීම 'ආ 18') නිකුත් කරන ලද නිලධාරියාගේ විස්තරය වේ.

**<u>අංක 30 - ජාතික හැඳුනුම්පත් අංකය</u>**

'ජාතික හැඳුනුම්පත් අංකය' යන්නට ඉදිරියෙන් ඇති කොටු තුළ හදිසි මරණ පරීක්ෂක හෝ අධිකරණ වෛද්‍ය නිලධාරීගේ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතු ය.

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජාතික හැඳුනුම්පත් අංකය | | | 7 | 9 | 2 | 6 | 4 | 0 | 4 | 6 | 3 | V |

**<u>අංක 31 - නම</u>**

'නම' යන වචනයට ඉදිරියෙන් ඇති කොටුව තුළ ඔහුගේ/ඇයගේ නම සිංහල හෝ දෙමළ භාෂාවෙන් සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| සම්පූර්ණ නම | කළුආරච්චිගේ තිලකසිරි |
| | වන්නිනායක |

**<u>අංක 32 - තැපැල් ලිපිනය</u>**

'තැපැල් ලිපිනය' යන්නට ඉදිරියෙන් ඇති කොටු තුළ හදිසි මරණ පරීක්ෂක හෝ අධිකරණ වෛද්‍ය නිලධාරීගේ රාජකාරි තැපැල් ලිපිනය සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| තැපැල් ලිපිනය | කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල |
| | දිස්ත්‍රික් මහරෝහල |
| | මීගමුව |

**<u>අංක 33 - දිනය</u>**

'දිනය' යන්නට ඉදිරියෙන් ඇති තීරයේ මරණ පරීක්ෂක තැනගේ සහතිකය (ලියාපදිංචි කිරීම 'ආ 18') නිකුත් කරන ලද දිනය සඳහන් කළ යුතු ය.
පහත සඳහන් කර ඇති ප්‍රකාශය දැනුම් දෙන්නා විසින් අත්සන් කළ යුතු ය. දැනුම්දෙන්නා විසින් දිනය සහ අත්සන අදාළ ස්ථානයේ යෙදිය යුතු ය.

ඉහත සඳහන් විස්තර සත්‍යවූත් නිවැරදි වූත් විස්තර බවත් සාවද්‍ය තොරතුරු සැපයීමෙන් ඇති වන නීතිමය ගැටලු සම්බන්ධයෙන් සියලු වගකීම මා බාර ගන්නා බවත් මෙයින් ප්‍රකාශ කරමි.

.............................. ........................................................

දිනය දැනුම් දෙන්නාගේ අත්සන

**තොරතුරු වාර්තා කරන නිලධාරියාගේ/ රෙජිස්ට්‍රාර්ගේ විස්තර** - තානාපති හෝ කොන්සල් නිලධාරියා විසින් සම්පූර්ණ කළ යුතු ය.

තොරතුරු සඳහන් කිරීම සඳහා අංක 34 සිට 36 දක්වා වූ කොටුවලින් මෙම කොටස සමන්විත ය. තොරතුරු වාර්තා කිරීම සඳහා භාරගත් තානාපති හෝ කොන්සල් නිලධාරියා පිළිබඳව මෙම කොටුවල සඳහන් කළ යුතු ය.

**<u>අංක 34 - ජාතික හැඳුනුම්පත් අංකය</u>**

'ජාතික හැඳුනුම්පත් අංකය' යන්නට ඉදිරියෙන් ඇති කොටු තුළ තොරතුරු වාර්තා කරන නිලධාරියාගේ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතු ය.

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජාතික හැඳුනුම්පත් අංකය | | | | 5 | 9 | 2 | 6 | 4 | 0 | 4 | 6 | 3 | V |

**<u>අංක 34 - නම</u>**

'නම' යන වචනයට ඉදිරියෙන් ඇති කොටුව තුළ තානාපති හෝ කොන්සල් නිලධාරියාගේ නම සිංහල හෝ දෙමළ භාෂාවෙන් සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| නම | මහේෂ් ක්‍රිෂාන්ත පෙරේරා |
| | |

**<u>අංක 35 - තැපැල් ලිපිනය</u>**

'තැපැල් ලිපිනය' යන්නට ඉදිරියෙන් ඇති කොටු තුළ අදාළ තානාපති හෝ කොන්සල් නිලධාරියාගේ කාර්යාලයේ තැපැල් ලිපිනය සඳහන් කළ යුතු ය.

| | |
|---|---|
| තැපැල් ලිපිනය | ශ්‍රී ලංකා තානාපති කාර්යාලය |
| | ප්‍රධාන විදිය |
| | රෝමය,ඉතාලිය |

තැපැල් ලිපිනය සඳහන් කොටුවට පහළින් ඇති කොටුවේ ' මරණ ප්‍රකාශය' ලියාපදිංචිය සඳහා භාර දෙන ලද තැනැත්තාගේ නම සඳහන් කළ යුතු ය. පහළින් අත්සන යෙදීමට ඇති ස්ථානයේ තානාපති හෝ කොන්සල් නිලධාරියාගේ අත්සන යොදා නිල මුද්‍රාව තැබිය යුතු ය. අදාළ ස්ථානයේ දිනය සඳහන් කළ යුතු ය.

........................................................... යන අයගෙන් ලද මරණ ප්‍රකාශය, සිවිල් ලියාපදිංචි කිරීමේ පද්ධතියේ ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරමි.

...............................  
දිනය

..........................................................................  
නිලධාරියාගේ / රෙජිස්ට්‍රාර්ගේ අත්සන හා නිල මුද්‍රාව

**කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණි** - සිවිල් ලියාපදිංචි කිරීමේ පද්ධතියට තොරතුරු ඇතුළත් කරනු ලබන නිලධාරියා විසින් සම්පූර්ණ කළ යුතු ය.

*'ඉහත සඳහන් තොරතුරු සිවිල් ලියාපදිංචි කිරීමේ පද්ධතියට ඇතුළත් කරන ලද නිලධාරියාගේ' යන්නට ඉදිරියෙන් ඇති නම යන කොටුවට ඉදිරියෙන් සිවිල් ලියාපදිංචි කිරීමේ පද්ධතියට තොරතුරු ඇතුළත් කරනු ලබන නිලධාරියාගේ නම සඳහන් කළ යුතු ය.

*’තනතුර’ යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ නිලධාරියාගේ තනතුර සඳහන් කළ යුතු ය.

*’අත්සන හා දිනය’ යන්නට ඉදිරියෙන් ඇති කොටුව තුළ සිවිල් ලියාපදිංචි කිරීමේ පද්ධතියට තොරතුරු ඇතුළත් කරනු ලබන නිලධාරියාගේ අත්සන හා තොරතුරු දත්ත පද්ධතියට ඇතුළත් කරනු ලැබූ දිනය සඳහන් කළ යුතු ය.